# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1843/45 - 2014 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2014.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.– බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

24 අ (1) වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමය මගින් -

(i) 2013.12.02 දින සිට බලපවත්වන පරිදි ශාස්ත්‍රවේදය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව අධ්‍යයනය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් වශයෙන් පශ්චාත් උපාධි මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ආයතනය පිහිටුවමි.

(ii) එම ආයතනයට "පශ්චාත් උපාධි මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය" යන නාමය හා අභිධානය දෙමි.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

---

එල්. ඩී.– බී. 21/78 (xiii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2013 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 01900— 560 (2014/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*